# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2143/52 - 2019 ඔක්තෝබර් මස 04 වැනි සිකුරාදා - 2019.10.04**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස - (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1 වන සංශෝධනය

**ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ සේවා ව්‍යවස්ථාව**

2018 දෙසැම්බර් මස 24 දිනැති හා අංක 2103/2 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලබන අතර මෙම සංශෝධිත විධිවිධානයන් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2019 පෙබරවාරි මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,<br>
ලේකම්,<br>
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2019 සැප්තැම්බර් මස 18 වැනි දින

10.1.1

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

10.2.1

I. උසස්වීම් සඳහා සුදුසුකම් ලබන දිනට සේවයේ II ශ්‍රේණියේ වසර හය (06) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හය (06)ක් උපයාගෙන තිබීම.

IV. අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

1A - G 31179 - 27 - (2019/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**10.2.1 යටතේ සඳහන් සුදුසුකම්වලට පහළින් පහත සටහන ඇතුලත් කරනු ලැබේ.**

**සටහන**

අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය තීරණය ගනු ලැබූ 2019 පෙබරවාරි මස 26 වැනි දිනට II ශ්‍රේණියට උසස්වීමට නියමිත සංශෝධිත 10.1.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සහ එදිනට පෙර II ශ්‍රේණියට උසස්වී ඇති නිලධාරීන්, III හා II ශ්‍රේණිවල වසර 12 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහ 10.2.1 I හි සඳහන් සුදුසුකම හැර 10.2.1 යටතේ සඳහන් අනෙකුත් සියළුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

10 - 648

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.